සැ. යු. - 2012.05.18 දින පළ වූ අංක 1,759 දරන ගැසට් පත්‍රයේ I-III සහ IV (අ) කොටස් පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2008 වර්ෂයේ ජනවාරි - මාර්තු කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,760 - 2012 මැයි මස 25 වැනි සිකුරාදා - 2012.05.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 960 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 964 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 965 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - (i) වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ශ්‍රී ලංකා පරිගණක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මුදල් පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට** තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජුනි මස 01 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මැයි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අතුරලිය ප්‍රාදේශීය සභාව

අතුරලිය ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති ආයුර්වේද ඖෂධ සංයෝජක තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති අතුරලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත සඳහන් කරුණුවලට අදාල අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර සම්පූර්ණ කර ලේකම්, අතුරලිය ප්‍රාදේශීය සභාව යන ලිපිනයට 2012.08.07 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|
| 01 | ආයුර්වේද ඖෂධ සංයෝජක | 01 | මාසික රු. 11,730- 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 රා.ප.ච. 06/2006 (iv) අනුව PLI 2006A ආරම්භක වැටුප 22 වැනි පියවර වේ. |

03. *අවම අධ්‍යාපන සුදුසුකම් :-*

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී අංක ගණිතය/ශුද්ධ ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම.

*නැතහොත්*

ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවකදී ගණිතය, සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06 කින් සාමාර්ථය ලබා තිබීම.

04. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :-* රජයේ ආයුර්වේද බෙහෙත් ශාලාවක හෝ පිළිගත් රජයේ ලියාපදිංචි ආයුර්වේද බෙහෙත් ශාලාවක කිසියම් තනතුරක වසරකට නොඅඩු කාලයක සේවා පළපුරුද්දක් තිබීම.

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු පුරුෂ/අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය.
(ii) තෝරා ගනු ලබන්නේ අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වය. එම කාලය තුල දී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ.

06. *වෙනත් පොදු කොන්දේසි :-*

(i) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
(ii) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික විය යුතුය.
(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
(iv) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු අතර රජයේ /පළාත් රාජ්‍ය සේවයේ පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
(v) අතුරලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වසර 03 ක පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි සහතිකය ප්‍රාදේශිය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.

07. *අයදුම් කළ යුතු ආකාරය :-*

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි A4 ප්‍රමාණයේ කඩදාසිවල පමණක් අයදුම්පත් 2012.08.07 වැනි දිනට හෝ එදිනට පෙර "ලේකම්, අතුරලිය ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය, පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.)

08. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික හා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන සහතිකය,
(iii) පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකයක්,
(iv) මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිවරයාගේ විය යුතුය.),
(v) වෘත්තීය පිළිබඳ සහතික තිබේ නම් එම සහතික,
(vi) සේවා සහතිකය (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි.).

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල අතුරලිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය. දෙමළ හා ඉංග්‍රීසි පරිවර්ථනවල අර්ථ ගැටීමක් ඇති වුවහොත් සිංහල අර්ථය ප්‍රමුඛ කොට ගත යුතුය.

ලේකම්,
සරත් ද සිල්වා සපුකොටන,
අතුරලිය ප්‍රාදේශීය සභාව.

අතුරලිය ප්‍රාදේශීය සභාව

**ආදර්ශ අයදුම් පත්‍රය**

***දකුණු පළාත් රාජ්‍ය සේවයේ අතුරලිය ප්‍රාදේශීය සභාවේ.............................................................. තනතුරට බඳවා ගැනීම***

01. *(අ)* මුලකුරු සමග නම :——————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. *(අ)* ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————.
*(ආ)* ස්ථිර පදිංචි ලිපිනය:——————.
03. ස්ත්‍රී/පුරුෂ භාවය:——————.
04. *(අ)* උපන් දිනය:——————.
*(ආ)* අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවු :——————.මාස:——————. දින:——————.
05. ජාතික හැඳුනුම්පත් අංකය:——————.
06. විවාහක/අවිවාහක බව:——————.
07. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද යන වග?:——————.
08. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කර තිබේද? එසේ නම් ඒ විස්තර ? නැත:——————.
09. අධ්‍යාපන සුදුසුකම්
*(අ)* විභාගයේ නම :——————.
*(ආ)* විභාග අංකය :——————.
*(ඇ)* සමත් වර්ෂය:——————.
*(ඈ)* සමත් විෂයයන්:——————.
10. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද? :——————.
11. ඔබ දැනටමත් මෙහි ආදේශිකව සේවය කරන්නේ නම් සේවා කාලය හා විස්තර එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/දීමනා/ආදේශක සඳහා ද යන වග):——————.
12. වෙනත් සුදුසුකම් :——————.
මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය බව හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් වන තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දනිමි.

——————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ
(දැනට සේවයේ නියුක්ත වූවන් පමණි.)

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත් තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවත් දැනට...................................... වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

——————.
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :——————.

05-545

## වැලිගම ප්‍රාදේශීය සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

වැලිගම ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| 01. | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| | සෞඛ්‍ය කම්කරු | 02 | යටත් පිරිසෙයින් 05 වැනි ශ්‍රේණිය සමත්වී සිටීම |

02. *වැටුප් පරිමාණය* : රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 -12 x 160 - රු.17,600

03. *පොදු සුදුසුකම් :-*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු අතර, වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල අවුරුදු 03 ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුය. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන සහතිකයට ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන යොදා තිබිය යුතුය.)

(ii) අයදුම්පත් බාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් සේවයේ නියුතු අයට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(iii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

(iv) දණ්ඩ නීති සංග්‍රහ යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(v) වැලිගම ප්‍රාදේශීය සභාවේ දැනට අදාල තනතුරෙහි අනියම් /තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/සේවා ගිවිසුම් මත සේවය කරන සේවකයින්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(vi) අයදුම්කරුවන් ඉහත දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

04. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(iii) වැන්දඹු පුරුෂ හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායකත්වය සඳහා මුදල් අයකෙරේ.

(iv) පත්වීම් ලැබූ දින සිට අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.

(v) මෙයට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ කොන්දේසි වලටද, මුදල් රෙගුලාසිවලට ද, දකුණු පළාත් සභාව, හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර පනවනු ලබන වෙනත් කොන්දේසි හා රෙගුලාසිවලට ද, පළාත් පාලන ආයතනවලට අදාළ ආඥා පනත්/පනත්වල විධිවිධානවලටද, වැලිගම ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට එකඟ විය යුතුය.

05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :-*

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2012.06.20 දින හෝ එදිනට පෙර ලැබෙන සේ "සභාපති, වැලිගම ප්‍රාදේශීය සභාව, වැලිගම" යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතිකය,
3. පදිංචිය සනාථ කිරීම පිණිස ග්‍රාම නිලධාරී නිකුත් කරන සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් සහිතව),
4. මෑතකදී ලබාගත් චරිත සහතික 2 ක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරී විසින් ලබාගත් සහතිකයක් විය යුතුය.),
5. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතිකය,
6. දැනටමත් මෙම සභාවේ අදාල තනතුරෙහි අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/සේවා ගිවිසුම් පදනම මත සේවය කරන්නේ නම් එම පත්වීම් ලිපි සහ සහතික.

06. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

පුෂ්ප කුමාර බැට්ටගේ,
සභාපති,
වැලිගම ප්‍රාදේශීය සභාව.

2012 ක් වූ අප්‍රේල් මස 27 වැනි දින,
වැලිගම ප්‍රාදේශීය සභා කාර්යාලය,
වැලිගම.

*ආදර්ශ අයදුම්පත්‍රය*

දකුණු පළාත් රාජ්‍ය සේවයේ වැලිගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති ප්‍රාථමික මට්ටම ශිල්පීය නොවන සේවයේ III වැනි පන්තියේ සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා බඳවා ගැනීම

01. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————.
(ii) මුලකුරු සමග නම :——————————.

02. ස්ථිර ලිපිනය :——————————.
03. ග්‍රාම නිලධාරි වසම හා අංකය:——————————.
04. උපන් දිනය : අවුරුද්ද:——————————. මාසය:——————————. දිනය:——————————.
05. ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු:——————————. මාස:——————————. දින:——————————.
06. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
07. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
08. වැලිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි කාලය වසර:——————————.
09. ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචියෙන්ද යන වග:——————————.
10. අධ්‍යාපන සුදුසුකම්:——————————.
11. වෙනත් සුදුසුකම්:——————————.
12. වෘත්තීය සුදුසුකම්:——————————.
13. සේවා පළපුරුද්ද:——————————.

(i) දැනට සේවය කරන ආයතනය:——————————.
(ii) දැනට දරන තනතුර:——————————.
(iii) එම තනතුරට පත් වූ දිනය:——————————.
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර:——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව මම දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන.... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ..... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය විසින් ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත්කරමි/නොකරමි.

——————————.
දෙපාර්තමේන්තුවේ/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

නම:——————————.
පදවි නාමය :——————————.
දෙපාර්තමේන්තුව/ආයතනය:——————————.
දිනය:——————————.

05-575

# පළාත් පාලන නිවේදන

## කළුතර ප්‍රාදේශීය සභාව

### ත්‍රී රෝද රථ නවතා තැබීමේ අතුරු ව්‍යවස්ථාව

1897 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) ඌ වැනි උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වැනි වගන්තියේ විධිවිධාන අනුව කළුතර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලදුව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1725/16 සහ 2011 සැප්තැම්බර් මස 29 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව කළුතර ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන එකී අතුරු ව්‍යවස්ථාවේ 02 වැනි සහ 3:1 වගන්තිය ප්‍රකාරව 2012 ජනවාරි මස 01 වැනි දින සිට එකී අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීමටත් වාර්ෂික ත්‍රීරෝද රථ නවතා තැබීමේ බලපත්‍ර ගාස්තුව ලෙස රු.600 ක් අය කිරීමටත් ත්‍රීරෝද රථ නවතා තැබීමේ ස්ථාන සහ නවතා තැබිය හැකි උපරිම ත්‍රීරෝද සංඛ්‍යාව පහත උපලේඛන පරිදි විය යුතු බවටත්, 2012.04.24 දිනැති මහ සභා තීරණ අංක : 7:1:2 යටතේ කළුතර ප්‍රාදේශීය සභාව විසින් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

දේශකීර්ති ලක්ෂ්මන් විදානපතිරණ,
සභාපති,
කළුතර ප්‍රාදේශීය සභාව.

2012 මැයි මස 09 වැනි දින,
කළුතර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| අනු. අංකය | නවතා තබන ස්ථාන | එක්වර නවතාතැබිය හැකි රථ සංඛ්‍යාව |
|---|---|---|
| 01. | නාගොඩ හංදිය ත්‍රීරෝද රථ ගාල | 06 |
| 02. | ටෙක්නිකල් හංදිය (කලමුල්ල) ත්‍රීරෝද රථ ගාල | 05 |
| 03. | හීනටියන්ගල පාර සෙන්ට්‍රල්හංදිය ත්‍රීරෝද රථ ගාල | 02 |
| 04. | හීනටියන්ගල පාර පොල්වත්ත හංදිය දූව පන්සල පාර ත්‍රීරෝද රථ ගාල | 03 |
| 05. | දූවපන්සල පාර ත්‍රීරෝද රථ ගාල | 03 |
| 06. | පලාතොට පාර බෝගහ හංදිය ත්‍රීරෝද රථ ගාල | 04 |
| 07. | පලාතොට හංදිය ත්‍රීරෝද රථ ගාල | 03 |
| 08. | පන්විල හේනවත්ත ත්‍රීරෝද රථ ගාල | 03 |
| 09. | පන්විල හංදිය ත්‍රීරෝද රථ ගාල | 02 |
| 10. | ගල්කැටියාව ත්‍රීරෝද රථ ගාල | 04 |
| 11. | මිහිකතවත්ත හංදිය ත්‍රීරෝද රථ ගාල | 04 |
| 12. | කිතුලාව මංසන්දිය ත්‍රීරෝද රථ ගාල | 03 |
| 13. | අල්විස්වත්ත හංදිය ත්‍රීරෝද රථ ගාල | 05 |
| 14. | කොළණිය හංදිය ත්‍රීරෝද රථ ගාල | 05 |
| 15. | රජවත්ත හංදිය ත්‍රීරෝද රථ ගාල | 03 |
| 16. | ගල්කිස්ස හංදිය ත්‍රීරෝද රථ ගාල | 06 |
| 17. | ගල්වල හංදිය ත්‍රීරෝද රථ ගාල | 02 |
| 18. | විජිත මාවත ත්‍රීරෝද රථ ගාල | 04 |
| 19. | ඇතගම ගල්කණුව අසල ත්‍රීරෝද රථ ගාල | 07 |
| 20. | දෙල්දූව පන්සල අසල ත්‍රීරෝද රථ ගාල | 04 |
| 21. | දෙල්දූව පාසල අසල ත්‍රීරෝද රථ ගාල | 02 |
| 22. | කන්ද කඩේ හංදිය ත්‍රීරෝද රථ ගාල | 05 |
| 23. | තරුණ සේවා මාවත හංදිය ත්‍රීරෝද රථ ගාල | 05 |
| 24. | නුගේ හංදිය ත්‍රීරෝද රථ ගාල | 04 |
| 25. | ආයුර්වේද හංදිය ත්‍රීරෝද රථ ගාල | 04 |
| 26. | සත්බුදු විහාරය අසල ත්‍රීරෝද රථ ගාල | 02 |
| 27. | කලපුගම පාසල අසල ත්‍රීරෝද රථ ගාල | 02 |
| 28. | මොරොන්තුඩුව හංදිය ත්‍රීරෝද රථ ගාල | 08 |
| 29. | ගෝනදූව රෝහල අසල ත්‍රීරෝද රථ ගාල | 05 |
| 30. | මාව හංදිය ත්‍රීරෝද රථ ගාල | 04 |
| 31. | මැස්ටිය හංදිය ත්‍රීරෝද රථ ගාල | 04 |
| 32. | මැලෑගම වත්තේ හංදිය ත්‍රීරෝද රථ ගාල | 06 |
| 33. | පට්ටේලිය බෝක්කුව අසල ත්‍රීරෝද රථ ගාල | 03 |
| 34. | නාගස්හංදිය පන්සල පාර අසල ත්‍රීරෝද රථ ගාල | 02 |
| 35. | විලේගොඩ හංදිය ත්‍රීරෝද රථ ගාල | 01 |
| 36. | දෙදියවල හංදිය ත්‍රීරෝද රථ ගාල | 03 |
| 37. | 1 කණුව අසල ත්‍රීරෝද රථ ගාල | 03 |
| 38. | මල්වත්ත හංදිය ත්‍රීරෝද රථ ගාල | 03 |
| 39. | උග්ගල්බඩ හංදිය ත්‍රීරෝද රථ ගාල | 03 |
| 40. | උග්ගල්බඩ පාසල මාවත අසල ත්‍රීරෝද රථ ගාල | 01 |
| 41. | 2 කණුව හංදිය ත්‍රීරෝද රථ ගාල | 02 |
| 42. | මිල්ලගස් හංදිය ත්‍රීරෝද රථ ගාල | 02 |
| 43. | 4 කණුව ත්‍රීරෝද රථ ගාල | 01 |
| 44. | ජාවත්ත හංදිය ත්‍රීරෝද රථ ගාල | 02 |
| 45. | මොරගහකන්ද ත්‍රීරෝද රථ ගාල | 03 |
| 46. | බන්ධනාගාරය අසල ත්‍රීරෝද රථ ගාල | 04 |
| 47. | මියුසියස් විදුහල අසල ත්‍රීරෝද රථ ගාල | 01 |
| 48. | වාඩියමංකඩ හංදිය ත්‍රීරෝද රථ ගාල | 10 |
| 49. | නුගගොඩ හංදිය ත්‍රීරෝද රථ ගාල | 06 |
| 50. | නාගස් හංදිය ත්‍රීරෝද රථ ගාල | 05 |
| 51. | කොස්ගස් හංදිය ත්‍රීරෝද රථ ගාල | 02 |
| 52. | නො. 01 දුම්රිය පොල පාර ත්‍රීරෝද රථ ගාල | 02 |
| 53. | මැද පොතුපිටිය ත්‍රීරෝද රථ ගාල | 02 |
| 54. | පොතුපිටිය පුෂ්පාරාමය අසල ත්‍රීරෝද රථ ගාල | 04 |
| 55. | ධීරක්කන්ද මාවත අසල ත්‍රීරෝද රථ ගාල | 03 |
| 56. | රෝයල් ෆාම් හෝටලය අසල ත්‍රීරෝද රථ ගාල | 02 |
| 57. | හයිබිස්කස් හෝටලය අසල ත්‍රීරෝද රථ ගාල | 09 |
| 58. | මර්මේඩ් හෝටලය අසල ත්‍රීරෝද රථ ගාල | 10 |
| 59. | රමාඩා හෝටලය අසල ත්‍රීරෝද රථ ගාල | 05 |
| 60. | සිද්ධාලේප හෝටලය අසල ත්‍රීරෝද රථ ගාල | 04 |
| 61. | හරිදා (වෙන්ඩෝල්) හෝටලය අසල ත්‍රීරෝද රථ ගාල | 04 |

05-649

**බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය සභාව**

2012.01.13 වැනි දින අංක 1,741 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(ආ) කොටසේ පලකරන ලද ගෝ ඝාතක ආඥාපනත යටතේ වූ උපලේඛනයේ අනු අංක 03 මෙම දැන්වීම මගින් අහෝසි කරනු ලැබේ. ඒ වෙනුවට පහත උපලේඛනයේ සඳහන් දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(ආ) කොටසේ පලකරන ලෙස මෙයින් දැනුම් දෙමි.

*ගෝ ඝාතක ආඥාපනත*

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානවල 2012 වර්ෂයේ මස් වෙළඳාම හා ගව ඝාතකාගාර වශයෙන් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලා අයදුම්පත් මාවෙත ඉදිරිපත් කර ඇති බවත්, එම බලපත්‍රය නිකුත් කිරීම ගැන බෝපෙ - පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණු සඳහා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv(ආ) කොටසේ පළ වූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත එවිය යුතු බවත් ගෝ ඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරය අංක 7(2) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ජී. සී. එස්. මාදුගොඩ,
සභාපති,
බෝපේ-පෝද්දල ප්‍රාදේශීය සභාව,
කලේගාන - ගාල්ල.

2012 මැයි මස 03 වැනි දින,
කලේගාන - ගාල්ල,
බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභාවේ දී ය.

*උපලේඛනය*

| | *ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය* | *වෙළඳාම* | *ගවමස් වෙළඳසැල* | *ගෝ ඝාතකාගාරය* |
|---|---|---|---|---|
| 03. | එම්. වයි. එස්. කරීම් මයා අංක 174/1, වැලිපිටිමෝදර 2 ගිංතොට. | කුරුඳුවත්ත එළගව මස් | අංක 449 කුරුඳුවත්ත එම්. ජේ. එම්. අස්වර් මහතාට අයත් කඩ කාමරයේ | ගිංතොට වැලිපිටිමෝදර අංක 103 හි පදිංචි එම්. බී. එම්. අම්ර්දීන් මහතාට අයිති ගිංතොට මහ හපුගල - මහවිල දූව වත්ත, පිඹුරු අංක 1935 හි කැබලි අංක ඩී |

05-618

---

# අතුරු ව්‍යවස්ථා

**වාරියපොළ ප්‍රාදේශීය සභාව**

පොදු වෙළඳපොළ "වෙළඳපොළ ප්‍රදේශය" ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

(257 වැනි අධිකාරිය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ගම්කාර්ය සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ එම අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 1974.08.30 දින අංක : 127 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමක් මගින් ප්‍රකාශයට පත්කොට ඇති පරිදි වාරියපොල වෙළඳපොල සම්බන්ධයෙන් වූ වෙළඳපොල ප්‍රදේශයක් එහි වෙළඳපොලේ සිට සැතපුම් දෙකක අර්ධ විශ්කම්භයක් වූ කවය ඇතුළත ප්‍රදේශයක් විය යුතුය. යන අතුරු ව්‍යවස්ථාව පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව තවදුරටත් වාරියපොල ප්‍රාදේශීය සභාව විසින් ද පිළිගත යුතු යැයි ද එම සංශෝධන ඇතුළත් අතුරු ව්‍යවස්ථාව නිවේදනය 2003.10.30 වැනි දින පැවති මහ සභාව විසින් ද පිළිගෙන එම යෝජනාව රජයේ *ගැසට් පත්‍රයේ* පළවූ දා සිට වලංගු එකක් සේ ක්‍රියාත්මක විය යුතු බවටද මෙයින් යෝජනා කරන්නීය.

1. වාරියපොල වෙළඳපොල සම්බන්ධයෙන් වන විට වාරියපොල නගර මධ්‍යයෙන් ආරම්භ වී දිවෙන මාර්ග සංවර්ධන අධිකාරියට අයත් හලාවත මාර්ගය සහ පුත්තලම් මාර්ගයද එම මාර්ගය දෙපස සම්බන්ධ කෙරෙන ඒ අධිකාරි මාවත ද යන මාර්ග තුනකට මායිම්වන බිම් කොටස වාරියපොල වෙළඳපොල වශයෙන් සලකා එම ප්‍රදේශයේ මධ්‍ය ලක්ෂයෙන් ආරම්භ වී දිවෙන සැතපුම් දෙකක අර්ධ විශ්කම්භය ඇති ප්‍රදේශය වෙළඳපොල ප්‍රදේශය විය යුතුය.

   1.1 මෙම වෙළඳපොල ප්‍රදේශය තුළ වාරියපොල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව කිසිදු වෙළඳපොලක්, වෙළඳපිලක්, මස් මාංශ අලෙවි සැලක් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම

හෝ ජංගම වෙළඳ රථයක් උපයෝගී කරගෙන වෙළඳාම් කටයුතු කිරීමද, වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම හෝ පවත්වාගෙන යාම ද නොකළ යුතුය.

2. බලපත්‍රයක් අතැතිව වුවද සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් පෙන්වා දෙනු ලබන ස්ථානවල හැර වෙනත් කිසිදු ස්ථානයක වෙළඳාම පවත්වාගෙන යාම හෝ ඒ සම්බන්ධව ප්‍රචාරණය කිරීම නොකළ යුතුය.

3. ඉහත වෙළඳපොල ප්‍රදේශය තුළ මස් මංශ අලෙවි කිරීම සඳහා වෙළඳසැල් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම, සතිපොළවල්, දිනපතා පොළවල්, දිවා රාත්‍රී පොළවල් පවත්වාගෙන යාමේ, ආරම්භ කිරීමේ අධිකාරිය වාරියපොල ප්‍රාදේශීය සභාව සතුවිය යුතුය.

4. මෙම වෙළඳපල බිම් කොටසක්, කඩපිලක් ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු හා කුළී සම්බන්ධයෙන් වන යෝජනාව මහාසභාවේ සම්මත කිරීම මගින් තීරණය කොට වාර්ෂිකව පවත්වාගත යුතුය.

"බලයලත් තැනැත්තා" යන්නෙන් තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකු ද "සභාව" යන්නෙන් වාරියපොල ප්‍රාදේශීය සභාවද අදහස් විය යුතුය.

ආනන්ද ජයලත්,<br>
සභාපති,<br>
ප්‍රාදේශීය සභාව - වාරියපොල.

2011 දෙසැම්බර් මස 23 වැනි දින,<br>
වාරියපොල ප්‍රාදේශීය සභාවේ දී ය.

05-647

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.